# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2266/73 - 2022 පෙබරවාරි මස 11 වැනි සිකුරාදා - 2022.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (කලින් කල සංශෝධිත පරිදි වූ) 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනය, (2019 අප්‍රේල් මස 30 වැනි දින අංක 2121/21 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "සම සෞඛ්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එකී උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "4. ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:

"5. දෘෂ්ටිමිතික අධ්‍යයනාංශය"

**දිනේෂ් ගුණවර්ධන,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0457


1A - PG 5747 — 611 (2022/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.